# ශ්‍රී ලංකා පොලිස් පරීක්ෂකවරුන්ගේ සංගමය

**ඩී. එස්. සේනානායක පාර, කොළඹ 05, ශ්‍රී ලංකා.**

දුරකථන / ෆැක්ස් : 2556629 වෙබ් අඩවිය : www.slpia.lk ඊ-මේල් : slpia@sltnet.lk


මගේ අංකය : එස්.එල්.පී.අයි.ඒ/බැහැර/118/20 ඔබේ අංකය :

2020.07.03

මේජර් ජෙනරල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මහතා,<br>
ආරක්ෂක ලේකම්,<br>
ආරක්ෂක අමාත්‍යාංශය,<br>
කොළඹ 03.

**<u>පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නීතිඥ වරුන් වන නිලධාරීන් සම්බන්ධව.</u>**

ඔබතුමන් විසින් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ සියළුම තරාතිරම් ඇතුලුව උසස්වීම් සම්බන්ධයෙන් ඉතා ධනාත්මකව කටයුතු කර ඔවුන්හට උසස්වීම් ලබා දීමට අවධානය යොමු කිරීම සම්බන්ධව ප්‍රථමයෙන් අප සංගමයේ හෘදයාංගම කෘතඥතාවය පුදකරන්නට කැමැත්තෙමු.

එමෙන්ම පරීක්ෂක ශ්‍රේණියේ, ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් ලෙස දිවුරුම් දී ඇති නිලධාරීන් විසින් ඔවුන්ගේ ගැටළු සම්බන්ධව අප සංගමය දැනුවත් කර ඒ සඳහා මැදිහත් වන ලෙසට ඉල්ලීම් කර ඇති අතර, එම ඉල්ලීමේ පිටපතක් මේ සමග අමුණා ඉදිරිපත් කරන්නෙමු.

ඔවුන් විසින් කර ඇති ඉල්ලීමෙහි ඇතුලත් අන්තර්ගතයන් පහත පරිදි වන අතර, එම කරුණු සම්බන්ධව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරවන අතර, එම කරුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා පොලිසිය තුල වැඩි නීතිඥවරුන් සංඛ්‍යාවක් සක්‍රීයව රාජකාරියේ යෙදවීම සුදුසු බවට අප සංගමයේද අදහස වන බව දන්වා සිටිමු.

i. වර්තමානව වන විටද ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ විසඳීමේ ප්‍රතිශතය ඉතා පහළ අගයක් ගැනීමට හේතුව නඩු මෙහෙයවීමේ ක්‍රියාවලිය සඳහා ශ්‍රී ලංකා පොලිසිය සතුව ප්‍රමාණවත් නීති වෘත්තිකයන් නොමැති වීම.

ii. ත්‍රිවිධ හමුදාවේ නීතිඥවරුන් ලෙස සේවය කරන නිලධරයන්ට නියමිත සුදුසු නිල තත්ත්වයන්, වෘත්තීය දිරිදීමනා, වැටුප් වර්ධක සහ අනෙකුත් පහසුකම් සලසා දී තිබුණද, ශ්‍රී ලංකා පොලිසිය තුල නීති වෘත්තිකයින්ගේ වෘත්තිමය භාවය සහ ගෞරවය ආරක්ෂා කිරීමට කිසිදු ක්‍රමවේදයක් නොමැතිවීම සහ එය තුල නීතිඥවරු වශයෙන් දිවුරුම් දෙන බොහෝ පරීක්ෂකශ්‍රේණියේ නිලධරයන් පොලිස් සේවය අතහැර යාමේ දැඩි ප්‍රවණතාවයක් පැවතීම.

iii. 2011.10.06 දිනැති පොලිස්පති චක්‍රලේඛ 2307/2011 යටතේ පළාත්බද නීති කොට්ඨාශ පිහිටුවා ඒවායෙහි ප්‍රධානියා වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දුන් නීතිඥ වරයෙකු හෝ නීතිවේදී උපාධිධාරී සහකාර පොලිස් අධිකාරී වරයෙකු පත්කල යුතුබවට සඳහන් කර තිබුණද, එම පුරප්පාඩු පිරවීමට තරම් ප්‍රමාණවත් සුදුසුකම් ලත් නිලධරයන් නොමැති වීම.

iv. උගත්පාඩම් සහ ප්‍රතිසංධානය පිළිබඳව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ 9.212 ට අනුව විමර්ශන කටයුතු සම්බන්ධ නීතිය සහ අධිකරණයේ නඩු මෙහෙයවීම සම්බන්ධව ප්‍රාමාණික දැනුමක් නොමැති වීම දක්වා තිබුණද, එය මගහරවා ගැනීමට මෙතෙක් ශ්‍රී ලංකා පොලිසිය ලෙස ක්‍රියාමාර්ග ගෙන නොතිබීම.

v. ශ්‍රී ලංකා පොලිසියේ පරීක්ෂකවරුන් ලෙස රාජකාරී කරන නීතිඥවරුන් නිසි ඇගයීමකට ලක් නොවීම මත ඔවුන් ශ්‍රී ලංකා පොලිසිය හැරයාම වැළැක්වීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම.

vi. නීතිඥවරුන් ලෙස දිවුරුම් දී ඇති පරීක්ෂක ශ්‍රේණියේ නිලධරයන් සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීම මගින් නීතිය හැදෑරීමට පොලිස් නිලධාරීන්තුල වැඩි උනන්දුවක් ඇතිවීම සහ එමගින් ඉදිරියේදී ඔවුන් හරහා ශ්‍රී ලංකා පොලිසියේ නිලධරයන් වෙත නීති දැනුම ලබා දීමට පහසු ක්‍රමවේදයක් නිර්මාණය වීම.

vii. සහකාර පොලිස් අධිකාරී තනතුරට ඉදුරාම බඳවා ගැනීමේදී ශ්‍රී ලංකා පොලිසියට හෝ නීති ක්ෂේත්‍රයට අදාල නොවන විෂය ධාරාවන්ගෙන් උපාධි ලබාගත් අයදුම් කරුවන්ගෙන් ලැබෙන දායකත්වයට වැඩි දායකත්වයක් නීතිඥවරු වශයෙන් දිවුරුම් දුන් පරීක්ෂකවරුන් සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමෙන් ලබා ගත හැකිවීම.

viii. බැරෑරුම් සහ සංකීර්ණ විමර්ශන වලදී කොළඹින් බැහැර කොට්ඨාශ සඳහා නීතිපතිතුමන්ගේ උපදෙස් ලබා ගැනීමේදී සිදුවන අපහසුතා අවම කර ගැනීමට හැකිවීම සහ එලෙස අවශ්‍යවන විටදී නීතිපතිතුමන් අපේක්ෂිත වෘත්තීමය මට්ටමින් ශ්‍රී ලංකා පොලිසිය නියෝජනය කිරීම සඳහා අවස්ථාව සැලසීම.

කරුණු එසේ හෙයින් දැනට පොලිස් සේවයේ සිටින ඇමුණුමෙහි තොරතුරු සඳහන් පරීක්ෂක ශ්‍රේණියේ නීතිඥවරුන් 11දෙනා නිසි ඇගයීමකට ලක්කර ඔවුන් සහකාර පොලිස් අධිකාරී තනතුරට උසස් කිරීමට කටයුතු කර එම නිලධරයන් ශ්‍රී ලංකා පොලිසියේ ඉහත කී කාර්යයන් සඳහා සක්‍රියව දායක කර වෘත්තිකයන්ගෙන් සැදුම් ලත් ශක්තිමත් හා අභිමානවත් පොලිස් සේවාවක් රට තුල ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කර එමගින් පරීක්ෂක ශ්‍රේණියේ නිලධාරීන්ගේ උසස්වීම් ගැටලුවට විසඳුමක් ලබා දීමෙන්ද සමස්ථ පොලිස් සේවයේ ප්‍රගමණය වෙනුවෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන මෙන් ඉතා ගෞරවයෙන් යුක්තව ඉල්ලා සිටිමු.

පොලිස් පරික්ෂක වරුන්ගේ සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

එස්. සංජය පෙරේරා,
ප්‍රධාන පොලිස් පරීක්ෂක,
සභාපති,
පොලිස් පරිෂකවරුන්ගේ සංගමය.

ගරු සභාපති
පොලිස් පරීක්ෂක සංගමය